# අමුතු කුරුල්ලා



නෙතුකි දම්සේයා අල්වීර



පළමු මුද්‍රණය 2025

කතාව සහ චිත්‍ර

**නෙතුකි දම්සේයා අල්වීර**

ISBN : 978-624-208-282-0

# පිදුම

සිතන්නට කියාදුන් අප්පච්චිටත්
ලියන්නට කියාදුන් අම්මාටත්
ආදරෙන්....

නෙතුකි දම්සේයා අල්වීර.
350/2,
රත්නකදෙනිය,
ඇඹිල්මීගම,
පිළිමතලාව.
2024.12.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්විදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



මලිනි චුටි ගැහැනු ළමයෙක්. එයා හැමදාම ඉස්කෝලේ යන්නේ කැළෑපාරක් මැදින්.




**ඒ කැළෑ පාර හරිම ලස්සනයි. චුටි කුරුල්ලෝ,බට්ටිච්චෝ,සමනලයෝ මේ කැළෑව තවත් ලසස්සන කරා. ඒ ගස් වල තියන මල් හරිම සුවදයි.ඒවාට මලිති හරිම ආසයි.**

දවසක් දා එයා ඉස්කෝලේ ඇරිලා එන්න ටිකක් සවස් වුණා. අඳුරත් වැටීගෙන ඇවිත් තිබුණා.

2

මලිත්‍රී ඉක්මනට ගෙදර යන්න පිටත් වුණා.



එතකොට එයාට අමුතු බය හිතෙන ශබ්දයක් ඇහුණා. එයාට හොඳටම බය හිතුණා.
එයා එක පිම්මට ගෙදර දිව්වා.



අම්මේ........ අම්මේ........
ඇයි මගේ චූටි දූ බය වෙලා වගේ?
අද දූ වෙලා ගිහින් නේද?
“ඔව් අම්මා”, අද සවස් ඉස්කෝලේ නාට්‍යයක් පුරුදු කළා.
අපි හොඳට රඟපෑවා කියලා, ගුරුතුමිය හැමෝටම ප්‍රශංසා කළා.




“ඒක නෙවේ අම්මා”, මම කැලෑ පාර දිගේ එනකොට ලොකු භයානක ශබ්දයක් ඇහුනා.



“ඒ මොන වගේ ශබ්දයක්ද දුව”?

“ඒක හරිම අමුතුයි අම්මා, මට ගොඩක් බය හිතුණා”. මලිති කීවා.





**මොකක්ද...?**

**මොකක්ද....?**

**මේ අම්මගෙයි, දුවගෙයි කතාව?**

**තාත්තා එතනට ආවා.**

ආනේ තාත්තාත් ගෙදර ඇවිත්.

“තාත්තේ”............ “තාත්තේ”...........

මම කෑලෑ පාර මැදින්7එද්දි, අමුතු භයානක ශබ්දයක් ඇහුණා.






**හ්හ්............හ්හ්........... හා..**

**“ඇයි තාත්තා හිනාවෙන්නේ” මලිති ඇහුවා.**

**අම්මාත් එතනට ආවා.**

ඒ ශබ්දය මටත් ඇහුනා. ඒ තමා “බකමූණා” තාත්තා කීවා. “එහෙනම් ඒ ශබ්දය ආවේ අමුතු කුරුල්ලෙක්ගෙන්” මලිති කීවා.





ඔව් දුවේ.., එයා නිශාචර පක්ෂියෙක් .

“ඒ කියන්නෙ තාත්තේ”?

මලිති ඇහුවා.

ඒ කියන්නේ එයා පරිසරයේ හැසිරෙන්නේ රාත්‍රී කාලයේදී. දවල් කාලයේදී එයාව දකින්න අමාරුයි.

“එයා නම් හරිම අමුතු කුරුල්ලෙක් නේද අම්මා?” ඔව් දුව, ඒකනම් ඇත්ත.

“මම මේ ගැන ඉස්කෝලෙ යාලුවෝ හැමෝටම කියනවා” මලිති සතුටින් උඩ පැන්නා.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයක් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විෂයතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ගුණීකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් වයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්